එක්සත් ජනපද ග්‍රීන් කාඩ් ලොතරැයිය විවෘත වේ

ලොව පුරා 50,000කට ග්‍රීන් කාඩ් දිනාගත හැකියි

කොළඹ - ඔක්තෝබර් 02, 2012: ග්‍රීන් කාඩ් ලොතරැයිය යන ජනප්‍රිය නාමයෙන් හැඳින්වෙන 2014 විවිධත්ව සංක්‍රමණික වීසා වැඩසටහන සඳහා 2012 ඔක්තෝබර් 02 වැනිදා සිට සබැඳි අයදුම්පත් භාර ගන්නා බව එක්සත් ජනපද තානාපති කාර්යාලය සතුටින් නිවේදනය කරයි. සෑම වර්ෂයකම ලොව පුරා අයදුම්කරුවන් අතුරෙන් අහුඹු ලෙස තෝරාගන්නා 50,000කට එක්සත් ජනපදයේ නීත්‍යානුකූල ලෙස ජීවත්වීමට, රැකියා කිරීමට හා අධ්‍යාපනය ලැබීමට විවිධත්ව වීසා ලොතරැයිය අවස්ථාව ලබාදෙයි. එකම අවශ්‍යතාව වන්නේ ඔවුන් සුදුසුකම් ලබන රටක ඉපදී තිබීමත්, (ශ්‍රී ලංකාව හා මාලදිවයින සුදුසුකම් ඇති රටවල් වේ) අධ්‍යාපනය හා රැකියා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් සපුරා තිබීමත් වේ.

විවිධත්ව වීසා ලොතරැයියට අයදුම් කිරීමට www.dvlottery.state.gov වෙබ් අඩවියට පිවිසෙන්න. වැඩසටහන පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට සහ ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාවෙන් උපදෙස් ලබාගැනීමට කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ srilanka.usembassy.gov/visas/diversity-visa-lottery-program.html. යන වෙබ් අඩවියට පිවිසෙන්න.

විවිධත්ව වීසා ලොතරැයියට අයදුම් කිරීම සම්පූර්ණයෙන්ම නොමිලයේ සිදුකෙරේ. අයදුම් කිරීමේ කාලසීමාව වන්නේ 2012 ඔක්තෝබර් 02 වැනිදා සිට නොවැම්බර් 03 වැනිදා දක්වායි. සිදුවිය හැකි ප්‍රමාදයන් වැළැක්වීම සඳහා කලින්ම අයදුම් කරන ලෙස මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමට කැමති පුද්ගලයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අයදුම්කරුවන් ලියාපදිංචි විය යුත්තේ එක්වරක් පමණි. එක් වතාවකට වැඩියෙන් අයදුම් කිරීම ස්වයංක්‍රීයවම නුසුදුස්සෙකු වීමට හේතුවනු ඇත.

2013 මැයි 01 වැනිදා පමණ සිට www.dvlottery.state.gov වෙබ් අඩවියට පිවිස තමන්ගේ තහවුරු අංකයෙන්, තම අයදුම්පතේ තත්වය පරීක්ෂා කළ හැකිවේ. ජයග්‍රාහකයින්ට තැපැල්, ඉ-තැපැල් හෝ දුරකථන පණිවුඩ මඟින් දැනුම්දීමක් නොකෙරේ. අයදුම්පත පිළිබඳ තොරතුරු මෙන්ම, සම්මුඛ පරීක්ෂණ පිළිබඳ විස්තර ලබාගත හැක්කේ www.dvlottery.state.gov වෙබ් අඩවිය තුළින් පමණි. තෝරාගනු ලබන අයට එක්සත් ජනපදයට සංක්‍රමණය වීමට අවුරුද්දක කාලසීමාවක් ලැබේ.

වැදගත් නිවේදනයයි.
එක්සත් ජනපද රජය වීසා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජනපද රජයෙන් බාහිර කිසිවෙකු යොදා නොගනී. තේරීමේදී වැඩි සැළකිලි ලැබෙන බවට පොරොන්දු වෙන හෝ එක්සත් ජනපද රජය සමඟ සබඳතා ඇති බවට ප්‍රකාශ කරන පුද්ගලයන් හා සමාගම් වලින් ප්‍රවේසම් වන්න. අයදුම්පත පිළියෙල කිරීමට බාහිර අතරමැදියකුගේ සහාය ලබා ගැනීම සම්පූර්ණයෙන්ම අයදුම්කරුගේ අභිමතය පරිදි වේ. ලොතරැයි අයදුම් කාලය තුල ලැබෙන සෑම අයදුම්පතක් සඳහාම එම කලාපයේ තේරීමට ඇති ඉඩ ප්‍රස්ථාව සමාන වේ. කෙසේ වෙතත් කුමන ප්‍රභවයකින් ලැබුණත් එක් පුද්ගලයෙක් සඳහා එක් අයදුම්පතකට වැඩියෙන් ලැබීම, එම පුද්ගලයා අයදුමට නුසුදුස්සෙක් කිරීමට හේතුවේ.